

# විකසිත

2023 මාර්තු
1 වන කාණ්ඩය
1 වන කලාපය

විද්‍යුත් කාව්‍ය සඟරාව

## පන්හිඳට පෙම් බඳින විහඟුන්ගේ ආමණ්ත්‍රණය



දන්කොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුබද්ධ
සංස්කෘතික බලමණ්ඩලයේ මාධ්‍ය අංශයේ ප්‍රකාශනයකි



# විකසිත



## අදහස හා යෝජනාව

නුවන්ති හංසිනී උත්පලා
( මාධ්‍ය අංශය )

## සංස්කාරක

ජයතිලක සෙනෙවිරත්න

## පරිගණක අක්ෂර සංයෝජනය

නුවන්ති හංසිනී උත්පලා
සසිඳු රන්මිත්

## කංචුක නිර්මාණය

නුවන්ති හංසිනී උත්පලා
සසිඳු රන්මිත්

## පිටු සැකසුම

නුවන්ති හංසිනී උත්පලා
සසිඳු රන්මිත්

## ඡායාරූප

දන්කොටුව
සංස්කෘතික බලමණ්ඩලය
නිල පිටුවෙන්

## දන්කොටුව සංස්කෘතික බලමණ්ඩලය

### ප්‍රධාන අනුශාසක

ආචාර්ය පූජ්‍ය මැදවච්චියේ විමලධම්ම හිමි

### ප්‍රධාන විධායක සභාපති

විජානි වසන්තිකා
( ප්‍රාදේශීය ලේකම් )

### සභාපති

ඒ. එම්. ධම්මික ගුණරත්න

### උප සභාපති

ඩී. එම්. කපිල දිසානායක

### ලේකම්

පී. ඩී. කාන්ති රම්‍යලතා

### උප ලේකම්

ශාන්ත නිමල් අහිංසක

### භාණ්ඩාගාරික

සිඩ්නි රෝහණ අප්පුහාමි

### මාධ්‍ය අංශය

නුවන්ති හංසිනී උත්පලා

ඩබ්. ඒ. ජේ. වනිගසේකර

# පටුන


හයිකු කවිවරු - ආචාර්ය මැදවච්චියේ විමලධම්ම හිමි

කලාව මිනිසා උදෙසාය - විජානි වසන්තිකා ( ප්‍රාදේශීය ලේකම් )

සොබාදහමට අවනතවීම කලාවට ආශිර්වාදයක්- ආයුර්වේද වෛද්‍ය එස්. ආර්. ඒ. ප්‍රියන්ත

කවිය - ජයතිලක සෙනෙවිරත්න ( සංස්කාරක )

හයිකු කවි - ආචාර්ය මැදවච්චියේ විමලධම්ම හිමි

රැහි ගීය - ජයතිලක සෙනෙවිරත්න

රතු බිල - ප්‍රින්ස් සේනාධීර

ඉසිඹු ලදිමි - ශිරාණි මංගලිකා

අප්පච්චියෙ මට ආසයි - නුවන්ති හංසිනී උත්පලා

දිවි සයුර - කපිල දිසානායක

පන්හිදේ විහඟුන්- 2021 ප්‍රාදේශීය සාහිත්‍ය තරඟාවලියේ ජයග්‍රාහකයෝ

මුහුදු රළට අවනත වෙමි- විමලසිරි අත්තනායක

මගේ රැය - වාසනා අනුරාධි

සිහිපත් කරමු හෙළ විරුවන්- කාන්ති රම්‍යලතා

මිනිසත්කම - ගාමිණී පීරිස්

ගැමි නිවසේ පොල් අතු බැදිල්ල - මංජුල හෙට්ටිආරච්චි

අපේ හඬට පෙම් බැඳ ඉගිලුනාදෝ - ශීලා වීරසේකර

පතනෙමි නැවත මම ලක්බිමෙ ඉපදෙන්න - සසිඳු රන්මිත්

( අ ) හිමි - නිමේෂා මදුශානි

වීණාවක වේදනාව - දිල්මි කවීශා

පුතේ මං යනවා - කවීෂා අංජලී

පන්හිදේ විහඟුන්- 2022 ප්‍රාදේශීය සාහිත්‍ය තරඟාවලියේ ජයග්‍රාහකයෝ

# සංස්කාරක සටහන

දන්කොටුව ප්‍රාදේශීය ලේකම් විජානි වසන්තිකා මැතිනියගේ මග පෙන්වීම හා පූර්ණ අනුග්‍රහය මත සංස්කෘතික අංශයේ නිලධාරීනියන්ගේ අප්‍රතිහත ධෛර්යෙන් හා ඉහමත් කැපවීමෙන් සංස්කෘතික බලමණ්ඩලයේ සහෘද සාමාජික භවතුන්ගේ සහයෝගයෙන් දියත් වූ සද්ව්‍යාපාරයක ප්‍රතිපලයක් ලෙස " විකසිත " නමින් විද්‍යුත් කාව්‍ය සංග්‍රහයක් ඔබ අතට පත් කිරීමට හැකි වීම අප ලැබූ ජයග්‍රහණයකි.


මෙම කාව්‍ය සංග්‍රහය අර්ථවත් කිරීමට මෙන්ම ඔපවත් කිරීමට ප්‍රවීණ කවියන්ගෙන් ලැබුණු දායකත්වය අතිශයින්ම ප්‍රශංසනීය ය. ඔවුනට අපගේ කෘතඥ පූර්වක ස්තූතිය පිරිනමමු. නිර්මාණ දායකත්වයෙන් මෙම සද්කාර්යයට සම්මාදන් වූ ආධුනික කවි කිවිඳියන්ට ද අපගේ ස්තූතිය පිරිනමමු. විශේෂයෙන් ම විකසිත වන්නට වෙර දරන මල් කැකුළුවන් අංකුර කවියන් හඳුනා ගැනීමටත් , ඔවුනගේ නිර්මාණ ඇගයීමට ලක් කිරීමටත් , එමගින් ඔවුන්ට සිය නිර්මාණ කුෂලතා වැඩි දියුණු කර ගනිමින් කවි මගේ ඉදිරියට යාමට අත්වැලක් වීමටත් ඔවුන්ගේ නිර්මාණ මෙහි ඇතුලත් කළෙමු. එබැවින් කාව්‍ය විචාර මිනුම්දඬුවලින් මැන ඔවුනගේ නිර්මාණ බැහැර කිරීමට අදහස් නොකෙළෙමු. අනාගතයේදී නිර්මාණ කෞශල්‍යයෙන් හෙබි ප්‍රතිභා පූර්ණ කවියන් පිරිසක් දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් බිහි වේවා යි ප්‍රාර්ථනා කරමු.

' කාව්‍ය ශාස්ත්‍ර විනෝදේන කාලෝ ගච්ජති ධීමතාම් ' කාව්‍ය ශාස්ත්‍ර ආදී සෞන්දර්ය රසාස්වාදනයෙන් ධීමතුන්ගේ හෙවත් නුවණැත්තන්ගේ කාලය අර්ථවත්ව ගතවේ. නිදා ගැනීමෙන් හෝ කලහකර ගැනීමෙන් මෝඩයන්ගේ කාලය ගත වේ. ප්‍රජාව සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලට යොමු කිරීම මගින් යහපත් පුරවැසියන් පිරිසක් බිහි කර ගැනීමට හැකි වේ. දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කාර්යාලය ඒ අරමුණ පෙරදැරිව ඉදිරියට තැබූ පියවරක් ලෙස " විකසිත " විද්‍යුත් කාව්‍ය සංග්‍රහය හැඳින්විය හැකිය.

සංස්කාරක
ජයතිලක සෙනෙවිරත්න

# හයිකු කවිවරු

## මත්සුඹ බෂෝ



සුප්‍රකට හයිකු කවියෙකු වන බෂෝ දකුණු ජපානයේ දුප්පත් සමුරායි පවුලක උපත ලැබුවේ ය. තදෝ යොෂිතදා යටතේ ඔහුගේ හමුදාවට සේවය කළ බෂෝ පසුව සමුරායි ජීවිතයෙන් ඉවත්ව කෝයා විහ-ාරස්ථානයට ගොස් පාවිදි විය. නොබෝ කලකින් ක්යෝතෝ නගරයට පැමිණි හෙතෙම එකල එහි විසූ අග්‍රගණ්‍ය හයිකු ආචාර්යවරයා යටතේ කවි කලාව ප්‍රගුණ කළේ ය.

පසුව සිය ගුරුවරයා මෙන්ම පද්‍ය බන්ධනයෙහි ශූරයෙකු වූ බෂෝ හයිකු පාසලක් ද ආරම්භ කළේ ය. ඔහු යටතේ හයිකු කවි කලාව හදාරා ජනප්‍රිය වූ පුද්ගලයන් රාශියකි. සවභාවධර්මයා විසින් මිනිස් ජීවිතය එක්තැන් කොට හයිකු සම්ප්‍රදාය තුළින් ඔහු අපට දයාද කළ රසවත් හයිකු වැකි ජීවිතයේ යථාර්තයම නොවන්නේ ද ? ඔහු මානව දයාවෙන් පිරිපුන් උතුම් මිනිසෙකි.

උමේ- ග කනි
නොත්තේ හි නොදෙරු
යමපි කනා

ප්‍රියකරු ප්ලම් කුසුම් මත
හිරු රැස් පතිත වෙයි
බලන්නට කන්දට නගින පාර

ආචාර්ය මැදවච්චියේ
විමලධම්ම හිමි

2016 දන්කොටුව ප්‍රාදේශීය
සංස්කෘතික බලමණ්ඩලය
මගින් සම්පාදිත ප්‍රභාෂ
සාහිත්‍ය සඟරාවේ උපුටා
දැක්වීමකි

2023

මාර්තු කලාපය

විකසිත

# කලාව මිනිසා උදෙසාය



සමාජයක් ගොඩනැගීමේදී කලාව සිදු කරන කාර්ය සුළුපටු නොවේ. කලාව සමාජය කෙරෙහිත් සමාජ සංස්ථා කෙරෙහිත් බලය පැතිරවීමට හැකියාවක් සහිත මාධ්‍යයකි. සමාජයේ යතාර්ථය මානව සිත් තුළට ගෙන යන ප්‍රධානතම මාධ්‍ය කලාවයි. කලාව හා සෞන්දර්යය තුළ ඇති සබැඳියාව ඔස්සේ ගීතය , නර්තනය , නාට්‍ය චිත්‍ර හා මූර්ති ආදී ලලිත සුලලිත කලාවන් නිර්මාණය වී ඇත. ඉතිහාසයත් සාහිත්‍යයත් යන දෙකම විෂය කොට ගත් මානව දිවියේ හැඟීම් හා සංවේදීතාවයන් ආවරණය කරන්නේ කලාව හරහාය.

කිසියම් වින්දනයක් ආස්වාදයක් රසයක් ලැබීමට හැකි ආකාරයට සකස් කළ ප්‍රතිභාවන් කලාවන් වන අතර රටක භාෂාවට අයත් ශාස්ත්‍රීය ලේකන නිර්මාණාත්මක පොත පත මෙන්ම මුඛ පම්පරාගතව සමාජයේ පවතින ජනශ්‍රැති හා ජනප්‍රවාදයන් මීට අයත් වේ. සාහිත්‍ය යනු අධ්‍යාත්මය සදාචාරය හා ජීවිත අවබෝධය යන ත්‍රිත්වයේ එකතුවක් බැවින් මානව සබඳතාවල ප්‍රකාශනය එයින් ප්‍රතිනිර්මාණය වෙයි. සමාජය තාක්ෂණය සමඟ කොතරම් ඉදිරියට ගියත් සමාජයේ ජීවත්වන මිනිසා ආස්වාදයක් ලබනුයේ කලාවෙනි. මේ නිසා කලාව ජීවිතයේ කම්කටොළු වලින් ගැලවී සිටීමට ජීවන ගැටළු ඉදිරියේ අකම්පිතව සිටීමට දරා ගැනීමට හා රසවින්දනයට මග පාදයි.

අද ලෝකය කොතරම් දියුණු වුවත් සමාජ හිතවාදී පරිකල්පනයෙන් සාරවත් ආකල්ප වලින් බොහෝ දුරස්ථව සිටී. දෙමව්පියෝ දරුවාව තරඟකාරී අධ්‍යාපනය ඔස්සේ ඉදිරියට ගමන් කරවීමට උත්සහා දරන අතර දරුවාගේ අභිලාෂය-න් නොව ඔවුන්ගේ දෙමාපියන්ගේ අභිලාෂයන් දරුවන් කෙරෙන් ඉටු කර ගැනීමට ප්‍රයත්න දරති .

සාහිත්‍යයට සංගීතයට නර්තනයට දක්ෂ දරුවන්ගේ එම දක්ෂතාවලට ඉඩහසර වෙන් නොකරන අධ්‍යාපන ක්‍රමයක් තුළ දරුවා ඔද්දල් වී ඇත. වැඩිහිටියන්ට ගරු නොකරන ආත්මාර්ථකාමී සමාජයක් ගොඩනගා තිබීමට වැඩිහිටි අප සැමවිටම වගකිව යුතු වේ. මෙම ක්‍රමය වෙනස් කිරීමට නම් ප්‍රථමයෙන් අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ යුතුය. පාසල් වයසේ දරුවන්ට සෞන්දර්යය හා කලාව සමඟ ජීවත්වීමට අවශ්‍ය වටපිටාව සකස්කළ යුතුය. සහකම්පනය සහිත දරුවෙකු නිර්මානය කිරීමට නම් නි-රතුරුව සාහිත්‍ය ආදි කලා මාධ්‍යයන් ඇසුරට දරුවෙකු යොමු කල යුතුය. එයින් ජීවිතයේ සොඳුරු ආභාසයන් ලබාගත හැකිය. වී ඇසුරෙන් ගීතයක් රසවිඳීම , පොතක් කියවීම , කවියක් ලිවීම යනාදිය සඳහා දරුවා හුරුපුරුදු වේ.

කලාවෙන් පෝෂණය වූ හදවත් ඇති දරුවන් අනාගතයේ බිහිවනු දැකීම දන්කොටුව සංස්කෘතික බලමණ්ඩලය ත්‍රෛමාසිකව එළිදක්වන මෙම විද්‍යුත් කවි සඟරාවේත් සමාජයේත් ඒකායන පරමාර්ථයයි.

විජානි වසන්තිකා
ප්‍රාදේශීය ලේකම්
දන්කොටුව

# සොබාදහමට අවනතවීම

## කලාවට ආශිර්වාදයක්



කලාව නම් වූ සුවිශාල වෘක්ෂයට මහපොළව තුළ නැගී සිටීමට සවිය දෙන්නා වූ මූල පද්ධතිය සොබාදහමයි.

කලාව හෝඩියට අත්පොත් තබන්නේද සොබාදහම තුළින්ය. එහෙයින් කලාව පසුකාලීනව කලාකරුවා නමින් පිදුම් ලබන මිනිසා විසින්ම නිර්මාණය කළ ග්‍රාහකයන් අමන්දානන්දයට පත්කරන අපූර්වත්වයෙන් හා සෞන්දර්යයෙන් යුතු නිර්මාණ රාශියකගේ එකතුවකි.

සොබාදහම සෞන්දර්යාත්මක දර්ශනයන් රාශියකින් සැඳුම්ලත් මනස්කාන්ත නිමැවුමකි. සොබාදහම්මාතාව අලංකාර කරන්නා වූ කඳුමුදුන් සිසාරා ඇද හැළෙන දිය ඇළි , මිදුමෙන් වැසී යන කඳු පන්ති , සොබා සිසිලස මවන්නාවූ තුරු වදුලු , නිල් දිය දහරාවන්ගෙන් පිරි ගංගා , ඇළදොළ මනසට සිසිලක් එක් කරන්නා වූ සියල්ලම කලාකරුවාගේ නිදහස් චින්තනය උදෙසා සෞන්දර්යාත්මක චිත්තවේග බිහිකරන්නට සමත් විය. එහෙයින් මිනිසාට සොඳුරු කලාකරුවකු ලෙස දිස්නය විදහා පාන්නට සිත් පිනවන්නා වූ නිර්මාණාත්මක දක්ෂතාවයන් මතින් කලා නිර්මණාණ බිහි කරන්නට අවශ්‍ය මූලිකම අඩිතාලම තබා දෙන්නේ හා මූල බීජයන් උත්පාදනය කරන්නේ සොබාදහමය.

සොබාදහම තුළින් හෝඩියට අත්පොත් තබා ලබාගන්නා කලාවේ මූල බීජයන් තම මනස්සෘතිය තුළ විචිත්‍රවත් කරගනිමින් රෝපණය කරගන්නා කලාකරුවා පරිකල්පනය තුළින් තම නිර්මාණාත්මක මාධ්‍ය භාවිත කරගනිමින් සොබාදහම හා කලාව අතර මිත්‍රත්වයක් ගොඩනගා සොබාදහමේ හා කලාවේ සම්මිශ්‍රණයක් ලබා ගන්නට සමත් වෙයි.

එයින් පසු කලාව නම් වූ සුවිශාල වෘක්ෂයෙහි විහිදී ශාඛාවන් ඔස්සේ විවිධ වූ අංශයන් කේන්ද්‍ර කොටගෙන විවිධ වූ නිර්මාණයන් සහ අපූර්වත්වයෙන් යුතු සිතිවිලි දරන්නට බිහිකරන්නට සමත් වෙයි.
මේ අතරින් සොබාදහම තදින් ග්‍රහණය කරගන්නා එක්තරා කොටසක් තම නිර්මාණශීලීත්වය විදහා පාන්නට උපකාරී කරගන්නා මාධ්‍ය ලෙස වර්ණ , චලන , රිද්ම විවිධ වූ නාදයන් ආදී යොදාගෙන සොබාදහම හා සම්මිශ්‍රණය කොට සොබාදහමෙන් උප්පත්තිය ලබන කලාවනම් වූ වෘක්ෂයෙහි සේවණ ලබන්නට යුහුසුළුව ඇත.

මිනිසා අධ්‍යාපනය තුළින් නුවණ ලබාගන්නා අතර ගුණය ලබාගන්නේ සොබාදහමට අනුගත වීම තුළිනි. එහෙයින් කලාකාමී මිනිසා සොබාදහමට බොහෝ ලෙංගතුය. නමුත් සමාජය ක්‍රමක්‍රමයෙන් දියුණුව කරා පියනගද්දී මිනිසාගේ මානසික මට්ටමද නිරායාසයෙන්ම විශාල විපර්යාසයකට ලක්ව ඇත.
මිනිසා හා සොබාදහම අතර පැවති ලෙංගතුකම හා සම්පතාව විකර්ෂණ බල සහිත කාන්දම් ද්විත්වයක්මෙන් කිසිදාක ලං නොවේ යැයි සිතන පරිද්දෙන්ම දුරස් වී යාමට පටන්ගෙනය. එහෙයින් කලාව තුළින් බිහිවන්නට මූල පුරන ගුණාත්මක නිර්මාණ සිටින්නේ හුස්ම ගිලිහෙන්නට ඉතාමත් ආසන්න මොහොතකය. සොබාදහමට අවනත වෙමින් ජීවිකාව ගෙන ගිය අතීත මිනිසා මෙන් නොව වර්තමාන මිනිසාගේ ජීවන රටාවල ගතිගුණ පමණක් නොව හැසිරීම් රටාව පවා අයහපත් ස්වරූපයෙන් වෙනස් වෙන්නට පටන්ගෙනය. එය මිනිසා සොබාදහමෙන් බැහැරවීමට උත්සහ කිරී මෙන් ලද අහිසි ප්‍රතිඵලයකි.

**අදහස් දැක්වීම - ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය එස්. ආර්. ඒ. ප්‍රියන්ත**

**සටහන - හංසිනී උත්පලා**

2023
මාර්තු කලාපය

විකසිත

# කවිය

කවිය යනු කුමක්දැයි අවසාන වශයෙන් පිළිගත හැකි නිර්වචනයක් මෙතෙක් ඉදිරිපත් වී නොමැත. එය ඒ තරම්ම සංකීර්ණ වූවකි. කාව්‍ය ශාස්ත්‍රය තරම් මතිමතාන්තරයෙන් ගහන වූ අන්‍ය ශාස්ත්‍රයක් නැති තරම් යැයි කිව යුතුය. සංස්කෘත සාහිත්‍ය පිළිබඳ විචාර චින්තාවන් පහළ වන්නේ සාහිත්‍ය සම්භවයෙන් බොහෝ කලකට පසුවය. මේ විචාර චින්තාවන් මගින් කාව්‍ය ලක්ෂණ ගුණ , දෝෂ , රීති ආදිය පිළිබඳව විවිධ මතිමතාන්තර ඉදිරිපත් කිරීමෙන් එය ශාස්ත්‍රයක් බවට පත් විය. ඒ අනුව කාව්‍ය ශාස්ත්‍රය සාහිත්‍ය අලංකාර ශාස්ත්‍රය වශයෙන් ව්‍යවහාරයට පත් විය.

කෙසේ වුවද කවිය පිළිබඳ වූ අංගෝපාංගයන් හා අනන්‍යතා ලක්ෂණ මෙන්ම කවියා සතු විය යුතු සුවිශේෂී නිපුනතා හා කුසලතා පිළිබඳ යම් ආකාරයක හඳුනා ගැනීමක් තුළින් කවිය පිළිබඳව යම් අවබෝධයක් ලබා ගත හැකි වේ යැයි සිතමි. ජීවිතය හා බැඳුණු දුක්ඛ දෝමනස්සයන් හා සුඛ සෝමනස්සයන් පිළිබඳව වූ අත්දැකීමක් නැතහොත් අනුභූතියක් පාදක කොටගෙන සාකල්‍යයෙන් ම සාරවත් වූ අර්ථපූර්ණ කාව්‍ය නිර්මාණයක් බිහි වෙයි.

ජීවිතය තුළින් තමා අත්විඳින පෞද්ගලික අනුභූතියක් පොදු අනුභූතියක් හෙවත් කාව්‍යානුභූතියක් බවට පත් කරමින් සහෘද සන්තාන තුළ සහකම්පනය ඇති කරමින් සුභාෂිත රසාස්වාදයක් ලබාදීම කවියාගේ අරමුණයි.

.

ඒ සඳහා අත්දැකීමෙහි අර්ථවත් බවත් අපූර්වත්වයත් ඉවහල් වෙයි. මෙහිදී කවියා සතු විශේෂ ගුණයක් වන්නේ ප්‍රතිභාවයි. ප්‍රතිභාව යනු අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ ප්‍රඥාවයි. අපූර්වත්වය තුළින් චමත්කාරය හට ගනී චමත්කාරය යනු සිත පුරවා දමන විස්මයයි. චමත්කාරය තුළින් රස ජනනය වෙයි. රසයේ සාරය චමත්කාරය බව විශ්වනාථ ප්‍රකාශ කරයි. සුලබ අත්දැකීමක් වුවත් නව්‍ය දෘෂ්ටි කෝණයකින් අවලෝකනය කිරීමෙන් කාව්‍යට අමුතුම

අපූර්වත්වයක් ලැබෙය අපූර්ව කාව්‍යානුභූතියක් මගින් රසිකයාගේ ජීවිතාවබෝධය පුළුල් කරවන මනුෂ්‍යත්වය පිළිබඳ කිසියම් පණිවිඩයක් දීම අපේ- ක්ෂිතයි. අර්ථවත් අත්දැකීමක් වන්නේ එවිටයි.. කවියාගේ කාර්යභාර්ය වන්නේ අත්දැකීම විස්තර කිරීම නොව අත්දැකීම පුනර්නිර්මාණය කිරීමයි. ඒ සඳහා කවියාට විශිෂ්ට පරිකල්පන ශක්තියක් තිබිය යුතුමය.


**ජයතිලක සෙනෙවිරත්න**



2023

මාර්තු කලාපය

# විකසිත



හ
යි
කු
ක
වි

කන්ද උඩ අසපුවේ
දහවල සැතපෙන හාමුදුරුවන්
ගොරවන හඬ
කෝකිල කූජනය

ෂිකි

අමතක නොකරන්න
අපි අපායෙ ඇවිදිමින්
මල් නරඹන බව

ඉසා

පන්සලේ ඝණ්ටාරය මුදුනෙ
ගුලිවෙලා සැතපෙයි
සමනලයෙක්

බුසොන්

හඳ , එක එක අත්තේ
එල්ලා
අත්හදා බැලුවෙමි

හොකුෂි

ආචාර්ය මැදවච්චියේ විමලධම්ම හිමි

# රැහි ගීය



අතීත සැමරුම් කඩු තුඩු ඇනෙනා
නිදි නැති යහනේ රෑ තුන් යාමේ
පාළු මකන්නට රැහී හඬනවා
රැව් පිළිරැව් දී නිරන්තරේ


සැළ මුතු නුගී පෙම් රස හව් විදුනා
පින් නැති පෙම්සිත් තුළින් නැගී එන
විරහ ගීතය ද මේ මුමුණන්නේ
සන්තාපය මා හද පුරවා

සයින් නිදන දරුවන්ගේ කෙදිරිලි
හඬින් පිබිදි මවකගෙ ළය මඬලේ
නැගෙනා සුසුමේ දෝංකාරය ද
රැහියනේ මා සවණ පුරන්නේ

අණ මිසක පණ නොවටිනා තැන
කුරිරු යුද බිම අවි දරාගෙන
නැසී ගියවුන් සිහිව නගනා
විලාපය දෝ මේ ඇසෙන්නේ

ජයතිලක සෙනෙවිරත්න

# රතු බිල



වැසි ඇද හැලෙද්දී
රෑ කල
රිදී රේඛා මතුකර
ගෙදරට - ලයිට් බිල මොකටද ?

විජ්ජු ලතා ගේ
විසිරුණු සේද රෙදි තැන තැන
මට බලන්නත් ලැජ්ජයි
ඔබ ඉන්න විට මා ළඟ
නොගෙවූ ලයිට් බිල එක්කම

අපේ රූපවාහිනිය ද අර. . ?
ඒ තරම් , තිර පුළුල් කරගෙන
කළු වලාකුළු අස්සෙත්
වැයමෙන් තරු ඔබාගෙන
ඔයාවයි , මාවයි වසාගෙන

කාමරේ නොතෙමෙන තැනට
ඇදගමු - අපේ බුදියන ඇඳ
ඉවිපන්දමක් වෙනුවට
පත්තුකර,
රෝල් කරගත් රතු බිල

**ප්‍රින්ස් සේනාධීර**

2023
මාර්තු කලාපය
විකසිත

# ඉසිඹු ලදිමි



ගෙවා සිව් තිස් වසක් ඔබ ළඟ
බෙදා ළඟ වූ දැනුම් සේසත
ලබා දහසක් දූ පුතුන් නෙක
ඔබ ළඟින් සිටි ගුරු මවකි මම

දයාවෙන් පිරි මුදු වදන් තුළ
දැඩි බවින් පිරි රළු වදන් තුළ
තිබු එකම දෙය මගේ හද තුළ
නොවේ කිසිවක් පමණි සෙනෙහස

මුදා හැර බැඳි සොඳුරු බැමිකඩ
බදාගෙන දෝතින් මතක පොත
විදා වියපත් පියාපත් යුග
නික්ම යන්නට කාලයයි මට

සතුට දුක ආදරය මුසුකොට
පුරන්නට ඉඩදී කඳුලකට
යන්න මගෙ අවසාන පිටුවට
ඉසිඹු ලන්නට අවසරයි මට. . .

ශිරාණි මංගලිකා එදිරිසිංහ

# අප්පච්චියෙ මට ආසයි සල්ලිකාර දුවක් වෙන්න



තට්ටු දෙකට ගෙයක් හදල නුඹලව එහී එක්ක යන්න
උඩුමහලේ බැල්කනියේ නුඹල එක්ක ගත කරන්න
නුඹෙ උකුලේ හිස තියාන පුංචි කාලෙ වගේ ඉන්න
අප්පච්චියෙ මට ආසයි සල්ලිකාර දුවක් වෙන්න

කාර් එකේ ඉස්සරහින් අප්පච්චිව තියන් යන්න
ඔය දෙන්නව ලෝකෙ වටේ සවාරියක් එක්ක යන්න
ලස්සන ලස්සන පාටින් ඇඳුම් ගොඩක් අරන් දෙන්න
අප්පච්චියෙ මට ආසයි සල්ලිකාර දුවක් වෙන්න

හැම දවසෙම බාර අරන් ආරාමෙට දානෙ දෙන්න
ළමා නිවාසෙකට ගිහින් පුංචි අයට තෑගි දෙන්න
ගිලන් අයට ඕනි බෙහෙත් මං තනියම අරන් දෙන්න
අප්පච්චියෙ මට ආසයි සල්ලිකාර දුවක් වෙන්න

නෑනි බෑරි කල උදව් කරපු හැමෝම ගැන බලාගන්න
ලෙඩ වුණාම හැමවෙලේම දුවල ගිහින් ළඟින් ඉන්න
ඔය දෙන්නව වගේම මට එයාලාවත් බලාගන්න
අප්පච්චියෙ මට ආසයි සල්ලිකාර දුවක් වෙන්න

**නුවන්ති හංසිනී උත්පලා**

2023

මාර්තු කලාපය

# විකසිත

# දිවි සයුර



තමහට සුවය දෙන සපිරුණු සිත් යායයි
වටපිට හැමට කලනැති සිත මෙත පායයි
රටතොට හැමට සිරිසෙත යසසිරු සෑයයි
ලෝකෙට උදාරයි ගුණ සිතුවිලි ගීයයි

පරහට සුව පිණිස දීමෙන් සැනසෙන්නේ
පිය වදනින් දනන් සිත් තිති සනසන්නේ
සුචරිත දිවි සැරිය යහපත සලසන්නේ
සමසිත් එකට රොද බැඳ දිවි ගෙවපන්නේ

සිතුවිලි සයුරෙ කිමිදුන මෙත් සිහිලාරේ
සරතැස නිවන කරුණාගුණ දිය දෝරේ
සුවසෙත සදන පැතුමන් හද හැම වාරේ
මැද සිත සනසමින් දිනු ගුණ අම දහරේ

අනියත සියලු දේ දැන පියවර තබමූ
සුබසෙත පිණිස දුක දැක කටයුතු කරමූ
මිහිමත මාද මගෙ නොවුනද නැත සිතමූ
දිවිගත කරමු ගුණ නැණ බල පතුරවමූ

සංගීතවේදී
කපිල සෙනරත් දිසානායක

2023

මාර්තු කලාපය

# විකසිත

# පන්හිදේ විහඟුන්

## ප්‍රාදේශිය සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහකයින්







2021

2023

මාර්තු කලාපය

විකසිත

# පන්හිඳේ විහඟුන්

## ප්‍රාදේශීය සාහිත්‍ය තරඟාවලියේ ජයග්‍රාහකයින්



2021

2023
මාර්තු කලාපය
විකසිත

# මුහුදු රළට අවනත වෙමි



පාලනයට හැකි විය මට
බලෙන් හිතන දේවල්
භාරගනිමි නො හැකියාව
ගත් වෙහෙසක අපමණ වූ
මෙහෙයවන්න සිත හැඟුමන්
ඉබේ මතුව වන සැකසුම්
හිතන විදිය , හිතෙන විදිය
හරි අපූරු මායා දැළ
ඇමට හසුව විඳවන ' සුරූ
බලා කියමු ජීවිතය යි...
ජීවන සිඳු තරණය මිස
ගිලී මියෙනු අනුවණකමැ
අවැසි නොවේ අමුතු විරිය
ඉහළ පහළ යන මුහුදේ
සියුම් රටා අසිරිය දැන
මුහුදු රළට අවනත වෙමි...

විමලසිරි අත්තනායක
සිංගක්කුලිය

# මගේ රෑය



අඳුරක් ද එළියක් ද - මට නොවූ වෙනසක්ය
පිණි වැටෙන හීතලේ - හීන් හිරිගඬු පිපුණා
ඒ සීතේ ගුලිවෙන්න - නොසොයනා කෙනෙක් වෙද
මේ බිත්ති හතර මැද - උණුසුම් තැනක් නැතුවැ

වාරු නැති නුඹෙ දෙපා - උණුහුමට තියන්නට
ගෙබිම මං වේලුවා - ලොව නිදන හැම රෑක
උණුසුම්ම නුඹ දෙපළ - නිදන කළ මහරෑට
සෝ සුසුම් නැහැ පිපුනෙ - සුදුම සුදු මල් මිසක

උඹේ හීන ඇහැරෙන්න - එපා හරි සීතලයි
ලොවම නිදිගත් අතරෙ ඇහිපියත් බිම බලයි
ලස්සනට හරිම හැඩ හීනයක් දකින්නට
එළිවෙන්න ඉඩ තියා සුව යහනේ නිදාපන්

වියපත්ව වැගිරෙනා - ගතේ පාඩම් ගොඩයි
ජීවිතය නොවිඳිනා එක හොඳයි මට හැඟෙයි
නුඹෙ පපුව උස් පහත් වෙනවාද බලා උන්
නොදැනීම ඒ ඩිංග මගේ හද නතර වෙයි

වාසනා අනුරාධී

# සිහිපත් කරමු හෙළ විරුවන්



ජාතික හැඟුම් නංවා හැමවිටම සිතේ
පරගැති බවට එරෙහිව අවි ඇතිව අතේ
නොබියව සටන් වැද රැකුමට අනාගතේ
සිහිපත් කරමු හෙළ විරුවන් දුවේ පුතේ

සියදහසකට වැඩි වෙල්යායකි ලස්ස
සරුකර පිරූ අටුකොටු ගොවියන් දස්ස
සතුරන් ඉදිරියේ වුව නොව පසු බැස්ස
මව්බිම සුරැකි ජාතිය හෙළයන් දස්ස

කැප්පෙටිපොළ වීර විරුවෙකි බූටැවේ
නොබියව පර සුද්දො සටනේදී කඩුගෑවේ
ඒ පළිගන්න කිරි දරුවන් උල ලෑවේ
තිබු වැව් අමුණු නැතිකර දැම්මයි ඌවේ

ඉතිහාසයේ ලියවී වෙල්ලස්සෙ බලේ
අද මෙන් හෙටත් සිහිකර උණු කඳුළු සැලේ
මහ මන්දිරේ මෙන් දුගියගෙ දිළිඳු පැලේ
සිටිනා අයට පාදා දෙනු මැනවි මොළේ

කාන්ති රම්‍යලතා

# මිනිසත්කම



දහසක් සිතිවිලි මැද්දෙන් වසර වසර ගෙවී යනවා
අතීතයක සැමරුම් මැද කවි සිතිවිලි ගලා එනවා
සහසක් අභියෝග මැදින් දිවි මංසල ළඟා වෙනවා
කඳුලක් නෙතු අගට ඇවිත් බින්දු බින්දු වෑහෙනවා

සමාජයක මිනිසත්කම කෙමෙන් කෙමෙන් දුරස් වෙලා
දෙමාපියන් වැඩිහිටියන් අසරණ වී තුවත් හෙලා
අපේ නොවේ මගේ යන්න සිතිවිලි අද වෙනස් වෙලා
හැම දෙයක්ම අනාගතේ කාසි වලට යටත් වෙලා

අපේ රටට නැවුම් ඉරක් කවදාදෝ පායන්නේ
සිතේ ඇතිවූ පැනයකි මට කෙලෙසද එය විසදෙන්නේ
ගතේ සවිය ඇතිතෙක් මා සැමහට පිහිටක් වන්නේ
ලොවේ උතුම් ලක්බිම තුළ කෙදිනක හෝ මිය යන්නේ

සාම විනිසුරු
ටී. එම්. ගාමිණී පීරිස්

2023
මාර්තු කලාපය
විකසිත

# ගැමි නිවසේ පොල්අතු බැඳිල්ල



පිටිසර ගෙපැල පැවතුන ඉස්සර දවස
පොල්අතු බඳිනු මතකයි එදවස හවස
ගම්වැසි රොක්ව එතනට නොබලම වෙහෙස
වහලට නැග්ගෙ එහි උන් වැඩිහිටි පිරිස

ගිත්තට තවපු අමු පොල් කොළවල සුවඳ
පොල්අතු උඩට යැව් හැටි මතකේ තිබද
ඉහළට යනු රිසින් කොලු ගැටයන් පැහැද
රසබර කතා කියූ හැටි සිහිවේ මහද

පහළින් පටන් බදිමින් එකඑක අත්ත
වහලෙන් කොණට යනහැටි මාසින ගත්ත
මුදුනෙන් බැන්දෙ හරවා එහි හොඳ පැත්ත
ඉනිමන් නැතිව රුවා බැස ගත යුත්ත

අහවර වෙලා පොල් අතු ඉරුවකම හිඳ
සම්බල සමඟ මඤ්ඤොක්කා බෙදන ලද
අනුභව කරල තේ කහවෙත් රසය විඳ
ගැමිකම සුවඳ බාලෙට ගෙන ගියා අද

නීතීඥ මංජුල හෙට්ටිආරච්චි

# අපේ හඬට පෙම් බැඳ ඉගිලුනාදෝ



ලොව අටදහම පිළිබඳ හොඳහැටි දන්න
කැරකෙන රෝදයක පිටුපස පියමැන්න
ලියමින් අරුත්බර පදවැල් අමුණන්න
මහගම කිවිඳු සේකර යළි මෙහි එන්න

සරසවි මැණියන් උකුලෙහි කිරි බිව්ව
ළා දලුපත් වැඩි අපටත් රස පෙව්ව
පුර සඳ සේම පායා හදවත් නිව්ව
තිවී පහන් විය ගීයක ඔබ ලිව්ව

පිලේ පැදුර පැලටම ගෙන ගියාදෝ
මැස්සෙ එලා ඕංගක් ඇල උනාදෝ
සිහිවී සොඳුර මේ කවි ලියෑ උනාදෝ
අමර හඬට පෙම් බැඳ ඉගිලුනාදෝ

තුන්මං හන්දියේ ඔබේ රූපයද වසා
මදුවැල් ඇදෙනවා ටික ටික අඳුර වසා
කඳුලක් නැගෙනවද කිවිඳුනි දෙඇස වසා
අඳුරැයි මේ නිසාවෙන් අද සතර දිසා

කලා භූෂණ
මඩවලපිටියේ ශීලා වීරසිංහ

# පතනෙමි නැවත මම ලක්බිමේ ඉපදෙන්න



සසරේ පිනකි මිනිසත් බව ලැබ ගැනුම
ඊටත් උතුම් මේ දෙරණේ ඉපදීම
ගහ වැල කොළ මලේ සිසිලස විඳ ගැනුම
ලක් මැණිගේ තුරුලෙහි හිඳ ජය ලැබුම

හිමිදිරි ගොම්මනේ හමනා පවනෙ අගේ
අවුරුදු සමයෙ එරබදු මල් පිපෙන රගේ
හැන්දෑ වෙන විටදී ගුවනේ තියෙන අගේ
ආඩම්බරෙන් කියනෙමි මේ රටයි මගේ

ලෙඩ දුක් වලින් පෙළෙනා අය සුව වෙන්න
දහමට ළැදිව සැමගේ සිත් සැනසෙන්න
විපතක් වෙතොත් මගෙ රට ඉන් ගොඩ එන්න
පතනෙමි නැවත මම ලක්බිමෙ ඉපදෙන්න

සසිඳු රන්මිත්

# ( අ) හිමි



ඉකිබිඳුම ඇස්වලට හුරු කෙරුව සඳවතී
හසරැල්ල මට හොරෙන් රැගෙන ගිය හිතවතී
හිත මතට මහබරට දුක් දුන්න මියුලැසී
කඳුලක් ව මියැදෙන්න අවසරද මිලින වී

හිනහවේ මද සුලඟ හදවතට අද නැතී
තහනම් ද ආදරය කියනු මැන පෙම්වතී
මා හෙලුව සුසුමක් ව සුළඟක් ව විත් ඇදී
රහසින්ම මා මියැදී බව කියා යනු ඇතී

මා මියැදී විගසින් ම ආත්මය මිලින වී
බොල් සුළං රැල්ලක් ව සමුගන්න එනු ඇතී
හමුවේවි ඔබත් ඔහු සමගින් ම පියනැගී
පණ අහිමි සිරුරකට සමුදෙන්න එන හැටී

**නිමේෂා මදුශානි වීරසිංහ**

# වීණාවක


# වේදනාව



සෙමින් තත් පිරිමැද
වෙණ වයන මූසිලයා
යහපත් නොවෙද
ශිල්පියෙක් යැයි උදම් අනා
වීණාවේ තත් සිඳිනා
ගුත්තිලට වඩා. . .

දිල්මි කවීශා

# පුතේ මං යනවා



හතරවට කළුවරයි ඇඳ උඩක උඹ වැටිලා
මෙල්ල නෑ මගෙ බහට තෙහෙට්ටුයි ඇඟපතට
හිතුවේ නෑ රිද්දන්න සංසාරේ ඇයි මෙහෙම
මං උඹේ අපුච්චා නොකියපන් සැර වචන

එහා වැට කුස්සියෙන් වෙල් මාළු හුරු සුවඳ
පිච්චුනේ මගෙ පපුව උඹෙ අම්මා එහෙ සිරිය
කොලනියේ උන්දැලට මූසල වූ මගෙ මූණ
ඉතිං මං තව කොහොම උහුලන්නේ මේ රිදුම

තුට්ටු දෙක අමුණලා හන්දියෙන් පාන් පෙති
දැකලා නෑ ලුණු හැන්ද බොර පාට පරිප්පුව
දවසටම එක වේල බිම දැම්මේ ඇයි මැණික
මං මැරුණෙ මගෙ කොල්ලා මත්කුඩට බිලි වූ දා

දැනෙයි අද සන්තෝසෙ වෙනද වගෙ නෑ රිදුම
උඹ ආස දේ ගත්ත අත තිබ්බ සොච්චමට
රෑ කෑම තියන්නම් නැළවෙච්ච මේසෙ උඩ
පුතේ මං වහ බිව්වා යමන් උඹ හරි ගමන

කවීෂා අංජලී

2023

මාර්තු කලාපය

විකසිත

# පන්හිඳේ විහඟුන්

## ප්‍රාදේශිය සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහකයින්



2022





2023

මාර්තු කලාපය

විකසිත

# පන්හිඳේ විහඟුන්

## ප්‍රාදේශීය සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහකයින්





2022

# 2023

## මාර්තු කලාපය

## විකසිත

# පන්හිඳේ විහඟුන්

## ප්‍රාදේශීය සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහකයින්













2022